# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,476 - 2026 පෙබරවාරි මස 13 සිකුරාදා - 2026.02.13**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී. )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත. )

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් | |

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 මාර්තු මස 06 දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 පෙබරවාරි මස 20 වැනි දින දහවල් 12. 00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට්* පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට්* පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය. "

2026 ජනවාරි මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

1 - B 082764— - (2026/02)
F 1 -

# පළාත් සභා නිවේදන

**මධ්‍යම පළාත් සභාව**

මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් කරන ලද නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව මධ්‍යම පළාත් සභාවේ 1993 අංක 04 දරන සමුපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තියෙන් සංශෝධිත මධ්‍යම පළාත් සභාවේ 1990 අංක 10 දරන සමුපකාර සමිති ප්‍රඥප්තිය යටතේ බලතල පැවරීම

මධ්‍යම පළාත් සභාවේ ආණ්ඩුකාරවර එස්. බී. එස්. අභයකෝන් වන මා වෙත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ඇ) ව්‍යවස්ථාවෙන් පැවරී ඇති බලතල අනුව මධ්‍යම පළාත් සභාවේ 1993 අංක 04 දරන සමුපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තියෙන් සංශෝධිත මධ්‍යම පළාත් සභාවේ 1990 අංක 10 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 2(2), 2(4) උපවගන්ති අනුව පහත අංක 1 තීරුවේ නම සඳහන් මධ්‍යම පළාත් සභාවේ සමුපකාර සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් (ශ්‍රී ලංකා පරිපාලන සේවය) වෙත III තීරුවේ සඳහන් බලතල II තීරුවේ සඳහන් දින සිට ක්‍රියාත්මක වන පරිදි පවරා දෙන බව මෙයින් ප්‍රකාශ කරමි.

**උපලේඛනය**

| *I තීරුව* | *II තීරුව* | *III තීරුව* |
|---|---|---|
| බී. එම්. පී. එස්. බී. බස්නායක මහතා | 2025.12.01 | මධ්‍යම පළාත් සභාවේ 1993 අංක 04 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියෙන් සංශෝධිත 1990 අංක 10 දරන මධ්‍යම පළාත් සමුපකාර සමිති ප්‍රඥප්තියෙන් අංක 8, 9, 33, 43 ,43අ, 44, 45, 46, 48, 52, 53, 58, (2අ, 3,4,5 උපවගන්ති හැර) 59, 60අ, 66, 67, 68, 69, 74, 75 සහ 1973 සමුපකාර සමිති රීති මාලාවේ අංක 4, 11, 15, 16 (II), 18, 19, 27, 32, 33, 35, 37, 39, 40, 41, 42, 43, 48, 49 (12ආ, ඇ, ඈ, ඉ උපවගන්ති හැර) 51, 52, 53 යන රීති යටතේ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් සතු බලතල. |

මහාචාර්ය එස්. බී. එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,
මධ්‍යම පළාත.

02-108/1

---

**මධ්‍යම පළාත් සභාව**

මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර විසින් කරන ලද නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව මධ්‍යම පළාත් සභාවේ 1993 අංක 04 දරන සමුපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තියෙන් සංශෝධිත මධ්‍යම පළාත් සභාවේ 1990 අංක 10 දරන සමුපකාර සමිති ප්‍රඥප්තිය යටතේ බලතල පැවරීම

මධ්‍යම පළාත් සභාවේ ආණ්ඩුකාරවර එස්. බී. එස්. අභයකෝන් වන මා වෙත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (ඇ) ව්‍යවස්ථාවෙන් පැවරී ඇති බලතල අනුව මධ්‍යම පළාත් සභාවේ 1993 අංක 04 දරන සමුපකාර සමිති (සංශෝධන) ප්‍රඥප්තියෙන් සංශෝධිත මධ්‍යම පළාත් සභාවේ 1990 අංක 10 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියේ 2(2), 2(4) උපවගන්ති අනුව පහත අංක I තීරුවේ නම සඳහන් මධ්‍යම පළාත් සභාවේ සමුපකාර සංවර්ධන නියෝජ්‍ය කොමසාරිස් (ශ්‍රී ලංකා පරිපාලන සේවය) වෙත III තීරුවේ සඳහන් බලතල II තීරුවේ සඳහන් දින සිට ක්‍රියාත්මක වන පරිදි පවරා දෙන බව මෙයින් ප්‍රකාශ කරමි.

උපලේඛනය

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* | *III වැනි තීරුව* |
|---|---|---|
| ඩී. ඩබ්. ජී. කේ. වඩුගොඩ මිය | 2025.12.05 | මධ්‍යම පළාත් සභාවේ 1993 අංක 04 දරන සමුපකාර සමිති ප්‍රඥප්තියෙන් සංශෝධිත 1990 අංක 10 දරන මධ්‍යම පළාත් සමුපකාර සමිති ප්‍රඥප්තියෙන් අංක 8, 9, 33, 43 ,43අ, 44, 45, 46, 48, 52, 53, 58, (2අ, 3,4,5 උපවගන්ති හැර) 59, 60අ, 66, 67, 68, 69, 74, 75 සහ 1973 සමුපකාර සමිති රීති මාලාවේ අංක 4, 11, 15, 16 (II), 18, 19, 27, 32, 33, 35, 37, 39, 40, 41, 42, 43, 48, 49 (12ආ, ඇ, ඈ, ඉ උපවගන්ති හැර) 51, 52, 53 යන රීති යටතේ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් සතු බලතල. |

මහාචාර්ය එස්. බී. එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,
මධ්‍යම පළාත.

02-108/2

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව - බස්නාහිර පළාත**

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සේවයේ රසායනාගාර කාර්මික ශිල්පී III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමේ (විවෘත) තරග විභාගය - 2025

**01.** බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සේවයේ රසායනාගාර කාර්මික ශිල්පී III ශ්‍රේණියේ තනතුරේ පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා බස්නාහිර පළාතේ වසර 03ක අඛණ්ඩ ස්ථිර පදිංචිය ඇති පහත සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම විභාගය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් ඉදිරි යෝජිත දිනයක දී පැවැත්වීමට නියමිතය. විභාගය පවත්වන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.

**02.** **වැටුප් පරිමාණය.-**

මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රා.ප.ච.10/2025 අනුව රු.52250 – 10 x 800 – 11 x 1190 – 10 x 1320 - 10 x 1350 - රු. 100040/ වේ. වැටුප් කේත අංකය MN 3- 2025 වේ. මෙම වැටුප ඔබට හිමිවන්නේ 2027.01.01 දින සිට වේ. එතෙක් මෙම චක්‍රලේඛයේ උපලේඛන III හි විධිවිධාන පරිදි වැටුප් ගෙවනු ලැබේ.

**03.** **පුරප්පාඩු සංඛ්‍යාව - 03**

**04.** **සුදුසුකම් :**

**4.1.** **අධ්‍යාපන සුදුසුකම්**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයෙන් රසායන විද්‍යාව ඇතුළුව තවත් විද්‍යා විෂයයන් දෙකක් එකවර සමත් වීම.

*සහ*

සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් 06කින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

**4.2 වෘත්තීය සුදුසුකම්**

ශ්‍රී ලංකා රසායන විද්‍යා ආයතනයේ රසායන විද්‍යාව පිළිබඳ රසායනාගාර තාක්ෂණවේදී ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම ;

*හෝ*

ශ්‍රී ලංකා රසායන විද්‍යා ආයතනයේ අධිකාරී සාමාජිකත්වය (L.I.Chem C.) ලබා තිබීම ;

*හෝ*

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ලබා ගත් රසායන විද්‍යාව / රසායනාගාර විද්‍යාව විෂයය ක්ෂේත්‍රයට අදාළ ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම ;

*හෝ*

තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ආයතනයකින් රසායන විද්‍යාව/ රසායනාගාර විද්‍යාව පිළිබඳ ජාතික වෘත්තීය කුසලතා (NVQ) 06 මට්ටමේ සුදුසුකම් ලබා තිබීම.

**4.3 පළපුරුද්ද** අදාළ නොවේ.

**4.4 කායික සුදුසුකම් :** තනතුරේ රාජකාරී ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත වීම.

**4.5 වෙනත් සුදුසුකම් :**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.
iii. අයදුම්පත් කැඳවන **2026.03.09** දිනට පූර්වාසන්න වසර 03 ක් අඛණ්ඩව බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
iv. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම්, අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ /ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

**4.6 වයස් සීමාව :**

**2026.03.09** දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 30 ට නොවැඩි විය යුතුයි.

**05. පවත්නා පුරප්පාඩු ක්ෂේත්‍රයන් :**

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ තාක්ෂණ සේවයේ රසායනාගාර කාර්මික ශිල්පී තනතුරෙහි මුළු පුරප්පාඩු 03 ක් පවතී. මෙම තනතුරෙහි පුරප්පාඩු සඳහා බඳවා ගැනීම සම්බන්ධයෙන් අවසන් තීරණය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

**<u>5.1</u> අයදුම්පත් භාර ගැනීමේ අවසන් දිනය 2026.03.09 දින වේ.**

**06. බඳවා ගැනීමේ ක්‍රමය :**

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සේවයේ රසායනාගාර කාර්මික ශිල්පී III ශ්‍රේණිය තනතුර සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටිය අනුව ලිඛිත පරීක්ෂණයක් පවත්වා විභාගය සමත් අයදුම්කරුවන්ගේ ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව සම්මුඛ පරීක්ෂණය පවත්වා පුරප්පාඩු සඳහා සුදුස්සන් තෝරා ගනු ලැබේ.

**මෙම තනතුර සඳහා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු දිනය 2026.02.23 දින වේ. මෙම දිනට තනතුරට බඳවා ගැනීමට අවශ්‍ය සියළු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.**

**07.** ලිඛිත විභාගය :

**07.1** ලිඛිත විභාගය ප්‍රශ්න පත්‍ර 02 කින් යුක්ත වේ.

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *අවම සමත් ලකුණු* |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |
| විෂයානුබද්ධ දැනුම | පැය 02 | 100 | 40 |

**07.2** විභාගය සඳහා විෂය නිර්දේශය

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | තර්කන ශක්තිය, ගණිත කුසලතාවයන්, තාර්කික තීරණ ගැනීම හා කාලය කළමනාකරණය කිරීම පිළිබඳ ඇගයීමේ බහුවරණ ප්‍රශ්න පත්‍රයකි. |
| විෂයානුබද්ධ දැනුම | **රසායනාගාර තාක්ෂණය පිළිබඳ මූලධර්ම :**<br><br>ආහාරවල මූලික සංඝටක - තෙතමනය, මේදය, ප්‍රෝටීන, ඛනිජ ලවණ, කාබෝහයිඩ්‍රේට් ප්‍රතිශත නිර්ණය කිරීම.<br><br>අනුදත්ත පරීක්ෂාව - පිෂ්ඨ වර්ග පරීක්ෂාව, කිරි විශ්ලේෂණය, මාංශමය ආහාර වර්ග විශ්ලේෂණය, ජෑම් කෝඩියල් හා අනෙකුත් පළතුරු නිෂ්පාදන විශ්ලේෂණය, විනාකිරි විශ්ලේෂණය, තෙල් හා මේද පරීක්ෂාව,පානීය ජල පරීක්ෂාව හා අපජල පරීක්ෂාව පිළිබඳ දැනුම.<br><br>**රසායනාගාර ආරක්ෂාව :**<br><br>උපකරණ භාවිතය, විබාදක රසායන ද්‍රව්‍ය භාවිතය හා විශ්ලේෂිත සාම්පල ඉවත් කිරීම පිළිබඳ දැනුම. |

**08.** සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය

**ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු :**

මූලික සුදුසුකම් පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා පවත්වනු ලැබේ. ලකුණු ලබාදෙනු නොලැබේ.

**පත්කිරීම් බලධරයා - බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

**09.** සේවා කොන්දේසි :

(අ) රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, 2019.11.13 දිනැතිව බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද බස්නාහිර පළාත් සභා කොළඹ මහා නගර සභාවේ ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සේවයේ රසායනාගාර කාර්මික ශිල්පී ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින්මතු කෙරෙන සංශෝධනවලට ද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධිවිධානවලට ද, අංක 2364/32 සහ 2023.12.29 වැනි දින දරණ අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීතිවලට ද, යටත්ව තෝරාගනු ලබන අපේක්ෂකයන් කොළඹ මහා නගර සභාවේ ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සේවයේ රසායනාගාර කාර්මික ශිල්පී III ශ්‍රේණියට පත් කරනු ලැබේ.

(ආ) විවෘත තරග විභාගයේ ප්‍රතිඵල මත බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සේවයේ රසායනාගාර කාර්මික ශිල්පී III ශ්‍රේණියට පත්කරනු ලබන නිලධාරියෙකු වසර

තුනක පරිවාස කාලයකට යටත්වේ. බස්නාහිර පළාත් කොළඹ මහා නගර සභාවේ ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සේවයේ රසායනාගාර කාර්මික ශිල්පී III ශ්‍රේණියට බඳවාගෙන වසර 03ක් ඇතුළත සේවා ව්‍යවස්ථාවේ සඳහන් පරිදි පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතුය.

(ඇ) 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හා එයට වරින් වර සිදු කරන සංශෝධනයන්ට අනුව නියම කර ඇති පරිදි දෙවන රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

**10.** විභාග ගාස්තු :

සෑම අයදුම්කරුවෙකුම විභාග ගාස්තුවක් බස්නාහිර පළාත් සභාවට ගෙවිය යුතුය. මෙම විභාගය සඳහා විභාග ගාස්තුව **රු. 1,200/=** කි. විභාග ගාස්තුව, බස්නාහිර පළාත් සභා ආදායම් ශීර්ෂ **20-03-02-99** ට බැර වන ලෙස අයදුම්පත්‍ර භාර ගන්නා අවසන් දිනට හෝ ඊට ප්‍රථම, බස්නාහිර පළාත් සභාව තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඔබගේ නමින් ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා තිබිය යුතුය. එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කුමන කරුණක් නිසාවත් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ ආපසු ගෙවනු නොලැබේ.

**11. අයදුම්කළ යුතු පිළිවෙල :**

I. සියලුම අයදුම්කරුවන් www.psc.wp.gov.lk යන බස්නාහිර පළාත් අපගේ නිල වෙබ් අඩවියට පිවිස මෙම විභාග නිවේදනය අනුව නිල වෙබ් අඩවියට උඩුගත (Upload) කර ඇති අයදුම්පත බාගත කිරීම සිදුකළ හැකිය.

II. අසම්පූර්ණ ලෙස තොරතුරු යොමු කර ඇති අයදුම්පත්, මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. සම්පූර්ණ කර එවනු ලබන අයදුම්පතෙහි ඡායා පිටපතක් අයදුම්කරු සතුව තබාගැනීම ප්‍රයෝජනවත් විය හැකිය.

**III. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :**

අයදුම්පතේ අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවෙකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා සහතික කරවා ගත් යුතු අතර අයදුම්පත ආයතන ප්‍රධානියා මඟින් යොමු කළ යුතුය. එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයෙකු, කොට්ඨාශයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියෙකු, රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍යාගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන අයෙකු ලවා සහතික කරනු ලැබ තිබිය යුතුය.

IV. මාර්ගගත ක්‍රමය ඔස්සේ අයදුම්පත් යොමු කළ හැකි අවසාන දිනය - **2026.03.09**

V. අපගේ නිල වෙබ් අඩවියට පිවිස, මාර්ගගත ක්‍රමය මඟින් **2026.03.09** දිනට ප්‍රථම අයදුම්පත් යොමු කිරීම සිදු කළ යුතු අතර, නිවැරදිව සම්පූර්ණ කර බාගත කර ගන්නා ලද අයදුම්පත් අයදුම්කරුගේ අත්සන සහිතව හා අත්සන සහතික කර ගැනීමෙන් අනතුරුව **2026.03.16** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. මෙදිනට පසුව ලැබෙන අයදුම්පත් භාර ගනු නොලැබේ.

ලේකම්, (බඳවාගැනීම් අංශය)
බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 628, 10 වන මහල,
ජනජයසිටි ගොඩනැගිල්ල,
නාවල පාර, රාජගිරිය.

අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහ නගර සභාවේ ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සේවයේ රසායනාගාර කාර්මික ශිල්පී III ශ්‍රේණියේ තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2025 "** ලෙස අනිවාර්යයෙන්ම සඳහන් කළ යුතුය.

VI. අයදුම්පතක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලෙදී නැතිවූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා අයදුම්පත් ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි හානිය අයදුම්කරුවන් විසින් විඳදරා ගත යුතුය. එමෙන්ම අයදුම්පත් ලැබුණු බව දන්වනු නොලැබේ.

VII. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිදු අයුරකින් සලකා බලනු නොලැබේ.

VIII. මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ද කිසියම් පුරප්පාඩුවලින් කොටසක් හෝ මුළුමනින්ම පිරවීම හෝ නොපිරවීම හෝ පිළිබඳව අවසන් තීරණය ගැනීමේ අයිතිය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ. එසේම මෙම බඳවාගැනීම කල් දැමීම, අවලංගු කිරීම හෝ පැවැත්වීමෙන් පසු තෝරා ගැනීම/ නොගැනීම පිළිබඳව අවසන් තීරණය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

IX. ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත පරිදි අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් පමණක් ලිඛිත පරීක්ෂණයන් සඳහා කැඳවනු ඇත. මේ සඳහා අයදුම් කරනු ලබන සියලුම අයදුම්කරුවන් සුදුසුකම් සම්පූර්ණ කර ඇතැයි උපකල්පනය කර ලිඛිත පරීක්ෂණය සඳහා සහභාගි වීමට අවස්ථාව දෙනු ලැබේ. ලිඛිත පරීක්ෂණය සඳහා සහභාගි වීමට අවස්ථාව ලබා දීම, සුදුසුකම් සම්පූර්ණ කර ඇති බවට පිළිගැනීමක් වශයෙන් නොසැලකිය යුතු ය. එසේ වුව ද අයදුම්කරු සුදුසුකම් සම්පූර්ණ කර නොමැති බව අනාවරණය වන ඕනෑම අවස්ථාවක දී අපේක්ෂකත්වය අවලංගු කිරීමට හා පත්වීම ලබා දීම ප්‍රතික්ෂේප කිරීමේ බලය බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

X. සම්මුඛ පරීක්ෂණ සඳහා නියමිත දිනයේදී සහභාගි නොවන අයදුම්කරුවන් පිළිබඳව කිසිදු අයුරකින් නැවත සලකා බලනු නොලැබේ. එමෙන්ම සම්මුඛ පරීක්ෂණ දිනයට සියලු සහතික ඉදිරිපත් කළ යුතු වන අතර පසුව ඉදිරිපත් කරනු ලබන කිසිදු සහතිකයක් බාරගනු නොලැබේ.

**12. විභාගයට ඇතුළත් කර ගැනීම :**

(අ) විභාගයට පෙනී සිටින අයදුම්කරුවන් විසින් තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින විභාග දිනයේදී එහි විභාග මධ්‍යස්ථාන භාර ශාලාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතුය. එවැනි ප්‍රවේශ පත්‍රයක් ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයෙකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී ම විභාගයට පෙනී සිටිය යුතුය.

**13. අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය :**

ප්‍රවේශ පත්‍රයක් නොමැති කිසිදු අයදුම්කරුවෙකුට විභාගයට පෙනී සිටීමට අවස්ථාව නොලැබේ. තවද, අයදුම්කරුවන් විභාග ශාලාව තුල දී පෙනී සිටින සෑම ප්‍රශ්න පත්‍රයක් සඳහාම විභාග ශාලාධිපති සෑහීමට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාවය ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

I. ජාතික හැඳුනුම්පත,
II. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
III. වලංගු රියදුරු බලපත්‍රය.

විභාග අපේක්ෂකයින්ගේ අනන්‍යතාව තහවුරු කර ගත හැකිවන පරිදි මුහුණු ආවරණය හා ඉලෙක්ට්‍රෝනික සන්නිවේදන උපාංග පැළඳ ගෙන නොමැති බව සනාථ කිරීම හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතුය. එසේ තම අනන්‍යතාව සනාථ කිරීම ප්‍රතික්ෂේප කරන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තවද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතුය.

**14. තෝරා ගැනීමේ ක්‍රමය :**

මෙම තනතුර සඳහා විභාගයෙන් දක්වන ලද කුසලතාවය අනුව සිදුකරනු ලබන සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණයකින් (ලකුණු ලබා දෙනු නොලැබේ.) පසුව සුදුස්සන් තෝරා ගනු ලැබේ.(පත්වීම් ප්‍රදානයේදී පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව පත්වීම් දියයුතු අවසාන ප්‍රමුඛතා මට්ටමේ සම ලකුණු ලැබූ අයදුම්කරුවන් කිහිපදෙනෙකු සිටින අවස්ථාවකදී එම සමලකුණු ලබාගත් අයදුම්කරුවන් සඳහා නැවත ලිඛිත පරීක්ෂණයක් පවත්වා එහි කුසලතාව මත පුරප්පාඩු ප්‍රමාණය සම්පූර්ණ කරනු ලැබේ.)

15. **ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් :**

අයදුම්පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයෙකු නුසුදුසු /අසත්‍ය තොරතුරු ලබා දී ඇති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පවත්වන අතුරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ඇත. පත්වීම ලැබීමෙන් පසුව හෝ සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති හෝ නිරවද්‍ය තොරතුරු යටපත් කර ඇති බව අනාවරණය වුවහොත් ඔහු /ඇය බස්නාහිර පළාත් රාජ්‍ය සේවයෙන් පහ කිරීමට හැකියාව ඇත.

16. විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීති රීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන ඕනෑම දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

17. විභාගය පැවැත්වීම, විභාගය අවලංගු කිරීම හෝ විභාගයේ ප්‍රතිඵල අත්හිටුවීම සහ ඊට අනුෂාංගිකව විභාග නිවේදනයේ විධිවිධාන සලසා නොමැති වෙනත් කවර හෝ කරුණක් සම්බන්ධයෙන් බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසාන තීරණය වන්නේය. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

18. මෙම නිවේදනයේ සඳහන් සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනුකූලතාවයක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි.

තිලක් සෙනරත්,
ලේකම්,
පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

දු.ක. - 011 2879614
ෆැක්ස් - 011 2879512
ඊ-මේල් - ppscwprec@sltnet.lk

**ආදර්ශ අයදුම්පත්‍රය**

***බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කොළඹ මහා නගර සභාවේ ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සේවයේ රසායනාගාර කාර්මික ශිල්පී III ශ්‍රේණිය තනතුර සඳහා වන බඳවා ගැනීමේ (විවෘත) තරග විභාගය - 2025***

විභාග අංකය : [ ]

(කාර්යාලීය ප්‍රයෝජන සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය (අදාළ අක්ෂරය කොටුව තුළ ලියන්න.)

සිංහල - S
දෙමළ - T
ඉංග්‍රීසි - E

[ ]

01. 1.1 සම්පූර්ණ නම(ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

(උදා. : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 මුලකුරු සමඟ අගට යෙදෙන නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

(උදා.: H.M.S.K.GUNAWARDHANA)

1.3 සම්පූර්ණ නම(සිංහලෙන්/දෙමළෙන් :

1.4 ජාතික හැඳුනුම්පත් අංකය :

**02.** 2.1 ස්ත්‍රී/පුරුෂ භාවය :

**03.** 3.1 විවාහක/අවිවාහක බව :

3.2 උපන් දිනය :

3.3 අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

**04.** 4.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :

ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :

4.2 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :

i. සිංහලෙන්/දෙමළෙන් :

ii. ඉංග්‍රීසි කැපිටල් අකුරින් :

4.3 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :

4.4 බස්නාහිර පළාතේ ස්ථිරව පදිංචිව සිටින කාල සීමාව :

4.5 විද්‍යුත් තැපැල් ලිපිනය :

4.6 දුරකථන අංකය ස්ථාවර :

4.7 තොරතුරු දැනුම් දීම සඳහා භාවිතයේ ඇති ජංගම දුරකථන අංකය :

❖ විභාගය සම්බන්ධ සියළු තොරතුරු ඉහත සඳහන් කරනු ලබන ජංගම දුරකථන අංකයට SMS ක්‍රමය මඟින් යවනු ලබන බැවින් වලංගු දුරකථන අංකයක් සඳහන් කරන්න.SMS පණිවිඩ නොලැබීම සම්බන්ධයෙන් පසුව කරනු ලබන පැමිණිලි සලකනු නොලැබේ.

**05. අධ්‍යාපන සුදුසුකම් :**

5.1 අධ්‍යයන පොදු සහතික පත්‍ර (අ.පො.ස. (සා./පෙළ.)) පිළිබඳ විස්තරය :

| | | |
|---|---|---|
| | *පළමු අවස්ථාව* | |
| i. විභාගයේ වර්ෂය හා මාසය: | | |
| ii. විභාග අංකය | | |
| iii. ප්‍රතිඵල | *විෂයය* | *සාමාර්ථය* |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

5.2 අධ්‍යයන පොදු සහතික පත්‍ර (අ.පො.ස (උ./පෙළ.)) පිළිබඳ විස්තරය :

| | | |
|---|---|---|
| i. විභාගයේ වර්ෂය හා මාසය : | | |
| ii. විභාග අංකය : | | |
| iii. ප්‍රතිඵල | *විෂයය* | *සාමාර්ථය* |
| | | |
| | | |
| | | |
| | | |

5.3 විභාග නිවේදනයේ 4.2 ඡේදය ප්‍රකාරව මේ විභාගයට පෙනී සිටීම සඳහා ඔබ ලබා ඇති වෘත්තීය සුදුසුකම් සම්බන්ධ පාඨමාලාව/ සුදුසුකම් පිළිබඳ විස්තර

I. විශ්වවිද්‍යාලය/ ආයතනය :

II. ඩිප්ලෝමාවේ නම :

III. ඩිප්ලෝමාව සම්පූර්ණ කළ දිනය :

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

IV. ශ්‍රී ලංකා රසායන විද්‍යා ආයතනයේ අධිකාරී සාමාජිකත්වය ලබා තිබේද ? :

V. වෙනත් සුදුසුකම් :.....................................................................................................

(ඉහතින් දක්වා ඇති සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාල වන සහතික/ ලේඛන අමුණන්න)

06. ඔබ කවරදාක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද?

6.1 ඉහත පිළිතුර"ඔව්"නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න. :...........................................................................
.......................................................................................................................................................

07. විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - ..........................................................................................

ලදුපත් අංකය - ..........................................................................................................

දිනය - ..........................................................................................................

මෙහි ලදුපත උඩුගත (Upload) කරන්න.

| | |
|---|---|
| **ලදුපත මෙම කොටුව තුල නොගැලවෙන සේ අලවන්න** | **ලදුපත UPLOAD කිරීමට හැකිවන සේ සකසන්න.** |

(ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදල් ගෙවා ලබාගන්නා ලද බ.ප. 1 ලදුපත පමණක් වලංගු වේ.)

**08. අයදුම්කරුගේ සහතිකය :**

.......................................................................................................................................................
........................................................................................ වන මා විසින් මෙම අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යැයි සොයාගනු ලැබුවහොත් බඳවාගැනීමෙන් පසු පත්වීම අවලංගු කිරීමට සහ/හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ කොළඹ මහ නගර සභාවේ ජන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ තාක්ෂණ සේවයේ රසායනාගාර කාර්මික ශිල්පී III ශ්‍රේණියේ තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නොසලකා හරිනු ලැබීමටද මට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබීමටද හැකි බව මම හොඳාකාරවම දනිමි.

දිනය :................................ ......................................,
අයදුම්කරුගේ අත්සන.

**09. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :**

මෙම අයදුම්පත ඉදිරිපත් කරන .................................................................................................................................... මහතා/මිය/මෙනවියගේ මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු /ඇය නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අයදුම්පතෙහි අලවා ඇති බවත්, ඔහු/ ඇය …............................................... වැනි දින මා ඉදිරිපිට දී ඔහු /ඇය ගේ අත්සන තැබූ බවත්, සහතික කරමි.

…..................................................................,

අත්සන සහතික කරන්නාගේ අත්සන හා නිල මුද්‍රාව.

දිනය :..................................................................................................

සහතික කරන්නාගේ සම්පූර්ණ නම :..................................................

තනතුර :...............................................................................................

ලිපිනය :.............................................................................................

**10. රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :**

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ........................................................................................ මයා /මිය/මෙනවිය දැනට ............................................................. කාර්යාලයේ /ආයතනයේ ................................................ දින සිට මේ දක්වා ............................................................... (තනතුර) වශයෙන් ස්ථිර /තාවකාලික /අනියම් (අනවශ්‍ය වචන කපා හරින්න) තනතුරක සේවය කරන බවද, ඔහුගේ / ඇයගේ සේවය සතුටුදායක බවද, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඇය /ඔහු තෝරා ගනු ලැබුවහොත් ඔහු / ඇය දැනට දරන තනතුරින් නිදහස් කරන බවද /නොකරන බවද, ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවද සහතික කරමි.

…..................................................................,

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව.

දිනය :..................................................................................................

සහතික කරන්නාගේ සම්පූර්ණ නම :..................................................

තනතුර :...............................................................................................

ලිපිනය :.............................................................................................

02-104

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.